# ටිරන් අලස් සහ මාධ්‍ය යුද්ධය

**සුනන්ද දේශප්‍රිය**

ටිරන් අලස් මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරණ සටනේ උතුරු නැගෙනහිර බාරව සිටි සෙන්පතියා විය. ශ්‍රීපති සූරියආරච්චි මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරණ මෙහෙයුම් මණ්ඩලයේ සිටි හතරදෙනාගෙන් එක් අයකු විය. රෝහන ගමගේ එම ජනාධිපතිවරන ව්‍යාපාරයේ වවුනියා සම්බන්ධිකාරක විය.

දැන් ටිරන් අලස් අත් අඩංගුවේ ය. චෝදනාව එල්ටීටීඊ යට උදව් කිරිම යි. ශ්‍රීපති අත් අඩංගුවේ සිට නිදහස් කැරුනේ චෝදනා නැතිව ය. නාවික නිලධාරියකු වූ රෝහණ ගමගේ එල්ටීටීඊ සහායකයකු ලෙස රාජ්‍ය ජනමාධ්‍ය විසින් ප්‍රසිද්ධියේ චෝදනා කරන ලදුව අත් අඩංගුවට ගැනුනි. චෝදනා නැතිව නිදහස් කෙරුනි. දැන් ඔහු ජීවත්වන්නේ අර්ධ රහසිගතව ය.

ජනාධිපතිවරණයේ ප්‍රධාන සෙන්පතියා වූ මංගල සමරවීර ද දැන් පිටුවහලෙකි. ඔහුද එල්ටීටීඊ සහායකු යැයි චොදනා ලබා තිබේ.

ඔවුන් කොටි සහාකයින් නම් ඔවිනගේ සහායෙන් බලයට පැමිණි මහින්ද රාජපක්ෂ ඊට යම් තරමක් හෝ වගකිව යුතු නැත් ද?

අනෙක් අතට සිදු වන්නේ කුමක් ද?

එම ජනාධිපතිවරනයේදී මහින්ද රාජපක්ෂ පරාජය කිරීමට ප්‍රසිද්ධියේ පෙනී සිටි ජනමාධ්‍ය ප්‍රධානීහු විවෘතව ද රහසිගතව ද දැන් මහින්ද රාජපක්ෂ ආණ්ඩුවේ ජනමාධ්‍ය මෙහෙයවති. ස්වකීය ජනමාධ්‍ය මගින් මහින්ද රාජපක්ෂ ආණ්ඩුවට දරදිය අදිති.

## වීරයින් ද්‍රෝහීන් වීම

**වීරයින් ද්‍රෝහීන් වී ද්‍රෙහීන් වීරයින් වී ඇත.** පුදුමය. ඒත් ඇත්ත ය. මෙවැනි දේ අසන්නට ලැබුනේ ස්ටාලින්ගේ රුසියාවේ ය. තමාගේ සමීපතම සගයින් මරණයට පත් කළ ස්ටාලින් තමන්ගේ විරුද්ධවාදීන් බිය ගන්වා අතවැසියන් බවට පත් කර ගත්තේ ය. දැන් සිදුවන්නේත් එයම ද?

නමුත් එකළ රුසියානුවන් අතර එම දේශපාලනය ගැන එතරම් අවබෝධයක් තිබුනේ නැත. මන්ද යත් මහජනයාගේ සිතිවිලි පාලනය කළ හැකි තරමට ස්ටාලින් පාලනය ජනමාධ්‍ය පාලනයක් ගෙන ගිය නිසා ය. ජනමාධ්‍ය පාලනය මගින් ඇත්ත නැත්ත කිරිමත් නැත්ත ඇත්ත කිරිමත් ස්ටාලින්ගේ සිට හිට්ලර් දක්වාත් පොල්පොට්ගේ සිට සුකර්නෝ දක්වාත් අනුගමනය කළ පිළිවෙත විය.

උතුරු නැගෙනහිර ජනයා ඡන්දය ප්‍රකාශ කරන බව වැලැක්වීම පිණිස තමන් මහින්ද රාජපක්ෂ වෙනුවෙන් එල්ටීටීඊ ය සමඟ හවුලකට ගිය බව හෝ යෑමට උත්සාහ කළ බවට ටිරන් අලස් සහ ශ්‍රීපති කරන චෝදනා ගැන මෙරට ජනමාධ්‍ය බොහොමයක් මුනිවත රකිති. එම ප්‍රකාශ එලෙස පිලි ගැනීම අවශ්‍ය නැත. නමුත් ජනමාධ්‍යයේ යුතුකම වන්නේ මෙම චෝදනාවන්හි ඇත්ත නැත්ත ස්වාධිනව සහ ගවේශනාත්මකව විමසා බැලීම යි.

මෙම චෝදනාව සත්‍ය ය නම් ඇත්ත වශයෙන්ම ජනමාධ්‍ය මගින් ආණ්ඩුවක් පෙරළා දැමිය හැකි තරමේ එකකි. එල්ටීටීඊ යට බල උදව් ජනාධිපති ප්‍රේමදාස මිය යනතුරුම ඔහුගේ පස්සෙන් එලෙව්වේ ජන මාධ්‍ය විසිනි. නමුත් අද ඇත්තේ භයානක නිහඬතාවයකි.

## ජෙනරල් රත්වත්තේ

යුද්ධයට වඩා දැන් කෙරෙන්නේ මාධ්‍ය යුද්ධයකැ යි පසුගිය දා නමගිය යුද්ධ වාර්තාකරුවකු කියා තිබුණි. මාධ්‍යයෙන් යුද්ධය දිනූ සෙන්පතියෝ පෙරත් මෙරට සිටියහ. හොඳම උදාහරණය ජෙනරල් රත්වත්තේ ය. ඔහු එකළ පුන පුනා කියා සිටියේ තමන් යුද්ධයෙන් සියයට 85ක් ම දිනා ඇති බව ය.

නමුත් අන්තිමේ දී ඇති වූයේ නටපු නැටුමකුත් නැති බෙරේ පළුවකුත් නැති තත්ත්වයක් බව අපි හැම දනිමු.

ජේ.ආර්ගේ සිට ප්‍රේමදාස සහ චන්ද්‍රිකා හරහා මහින්ද රාජපක්ෂ දක්වා කියන තවත් කතාවක් තිබේ. එනම් ත්‍රස්තවාදය පරාජය කිරීමේ සටන හරියට කරන්නේ තමන් ම පමණක් බව යි. තමන්ට පෙර සිටි කිසිම පාලකයකු යුද්ධය හරියට නොකළ බව කියා සිටීම යි.

මාධ්‍ය යුද්ධයේ ලොකුම කාරිය තමන්ට වාසිදායක වන ලෙස සකස් කරන ලද බොරු තොරතුරු පැතිරවීම ය. එම තොරතුරු මගින් කාර්යයන් කිහිපයක් ඉෂ්ඨ කර ගත යුතු ය.

**පළමුවැන්න** නම් යුද්ධයෙන් තමන් ජය දිනා ඇති බව මාධ්‍ය හරහා තහවුරු කිරීම යි. එමගින් යුද්ධය වෙනුවෙන් තමන් කරන සෑම ක්‍රියාවක්ම සෑම ගනුදෙනුවක්ම සාධාරණ බව පෙන්වා සිටීම යි.

**දෙවැන්න** නම් ස්වකීය දේශපාලන විරුද්ධවාදීන් සතුරාට උදව් කරන බව මාධ්‍ය මගින් තහවුරු කිරීම යි. එමගින් දේශපාලන විවේචනයන් හැකිතාක් ජනමාධ්‍යයෙහි පළවීම අවම කර ගැනීම යි.

**තෙවැන්න** යුද්ධය දිනාගෙන එන බැවින් මානව හිමිකම් පිළිබඳව කතා කිරීම ටික කළකට පස්සට දැමිය යුතු බව තහවුරු කිරීම යි. එමගින් ඕනෑම යුද්ධයක කොටසක් වන මානව හිමිකම් උල්ලංඝනයන් වාර්තාවීම වළක්වා එවැනි තත්ත්වයක් රටෙහි නැති බව ජන මාධ්‍ය මගින් පෙන්වා දීම යි.

යුද්ධයෙන් ජය දිනා ඇති බව තහවුරු කිරීමට පරාජයන් වසා දැමිය යුතු ය. ජයග්‍රහණයන් අතිශෝක්තියට නැංවිය යුතු ය.

## එල්ටීටීඊ ප්‍රහාර

පසුගිය දා යාපනයේ ඩෙල්ෆ් දූපතෙහි දී සහ වවුනියා මන්නාරම් මාර්ගයේ පම්පෙයිමඩු හි දී එල්ටීටීඊ ය කරන ලද ප්‍රහාරයන් ආණ්ඩුව සහමුලින්ම වාගේ මාධ්‍ය මගින් යටත් කර දැමුනි. මෙම ප්‍රහාරයන් දෙකෙහි දී ම එල්ටීටීඊ ය කුඩා යුද කඳවුරු දෙකක් විනාශ කොට අවි ආයුධ අල්ලා ගත්තේ ය. එක් ප්‍රහාරයක් කැරුනේ මුහුදිනි. අනෙක ගොඩබිමිනි.

පොම්පෙයිමඩු ප්‍රහාරයේ දී මිය ගිය සොල්දාදුවන්ගේ සිරුරු 14ක් බාර ගැනීම ශ්‍රී ලංකාණ්ඩුව ප්‍රතික්ෂේප කළා ය. හරියට මුලතිව් ප්‍රහාරයේ දී මියගිය දහසක් තරම් සොල්දාදුවන්ගේ සිරුරු බාර ගැනීම එකළ ආණ්ඩුව ප්‍රතික්ෂේප කළ පරිදිය. සිංහල ජනමාධ්‍ය කියවන අසන බලන කිසිවකු මෙම තොරතුරු දන්නේ නැත. දැන් ආණ්ඩුව කියන්නේ සොල්දාදුවන් 28 දෙනෙකු අතුරුදහන් වූ බව යි.

මෙම තොරතුරු ප්‍රකාශයට පත්කරන ජනමාධ්‍ය හෝ දේශපානඥයින් හෝ සිවිල් සංවිධාන හෝ වෙතොත් ඒ සියල්ල එක්වරම කොටි සහායකයින් යැයි හංවඩු ගැසේ. රටෙහි සිදුවිය යුතු අත්‍යවශය සමාජ දේශපාලන සාකච්ජා සහමුලින්ම වසා දමා ඇත්තේ එම බිය වැද්දවීම මගිනි.

උතුරු නැගෙනහිර සිදුවන සිවිල් වැසියන් ඝාතනය කිරීම් දකුණට වාර්තා නොවන්නේ ද එනිසා ය. සෑම දිනකම වාගේ උතුරු නැගෙනහිර සිවිල් වැසියන් දෙතුන් දෙනෙකු මරා දැමෙති. යුද්ධයේ සියලු පාර්ශවයන් මෙම ඝාතනයන්ට වග කිව යුතු ය. නමුත් මෙම ඝාතනයක් සිදුවන්නේ ශ්‍රී ලංකා ආණ්ඩුවේ වචනයෙන් කියන්නේ නම් මුදා ගත් ප්‍රදේශවලදී ය. එබැවින් මෙම ඝාතයන්ගේ වැඩිම වගකීම පැවරෙන්නේ ආණ්ඩුවට ය.

## චන්ද්‍රිහට්ට ජනමාධ්‍ය

එබැවින් මෙම ඝාතනයන් සිදු නොවන බව ජනමාධ්‍ය මගින් කියා සිටීමට ආණ්ඩුවට අවශ්‍ය ය. ඒ සා ආරක්ෂ විධිවිධාන ඇති කොළඹ කොටුව දුම්රිය පොළෙහි හතරවන වේදිකාවේ සිට රතු කුරුස තරුණයින් දෙදෙනා පැහැර ගැනීමට හැකියාවක් ඇත්තේ කාට ද? එම තරුණයින් කොළඹ සිට කිරිඇල්ලට ගෙන යාමට හැකියාවක් ඇත්තේ කාට ද? එම වාහනය කරුණා පිළට අයත් නම් ඒ ගැන එම පිලෙන් ප්‍රශ්න කෙරුනි ද?

එම සහ තවත් එවැනි ප්‍රශ්න විමසා ලියූ ලිපියක් ඔබ කවර හෝ පුවත්පතක කියවීද?

ඍජුව සහ වක්‍රව කවර හෝ ආණ්ඩුවක මර්ධනකාරී පිලිවෙත් වලට සහාය දෙන ජනමාධ්‍ය සහ කතුවරුන් සමාජයට මෙන්ම එම ආණ්ඩුවට ද  කරන්නේ කරන්නේ හොඳක් නොවේ. හානියකි. චන්දිභට්ටයින් වටකරගත් පාලකයකුට පෙනෙන්නේ සැබෑ තත්ත්වය නොව තමන්ම මවා ගත් මායාව ය.

සුනන්ද දේශප්‍රිය